# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - (පළමු සෙමෙස්තරය) - 2017/2018

## PSC - 3161 - ස්ත්‍රීපුරුෂ සමාජභාවයේ දේශපාලනය : න්‍යාය සහ සංකල්ප

**කාලය : පැ දෙකයි (02)**

ප්‍රශ්න **තුනකට ( 03 )** පමණක් පිළිතුරු සපයන්න.

එක් පිළිතුරකට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය **විස්සකි (20 ).**

---

01. පැහැදිලි කරන්න :
    (i) ස්ත්‍රීපුරුෂ සමාජභාවීය භූමිකාව
    (ii) ස්ත්‍රීපුරුෂ සමාජභාවීය සබඳතා
    (iii) ලිංගික ශ්‍රම විභජනය

02. සමාජ, ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික අවකාශය තුළ කාන්තා පීඩනය කෙරෙහි පීතෘමූලිකත්වය හේතුවන්නේ කෙසේ ද? පැහැදිලි කරන්න.

03. විභාග කරන්න :
    (i) ස්ත්‍රීපුරුෂ සමාජභාවීය සංවර්ධනයේ ප්‍රධාන න්‍යායන්; සහ
    (ii) ස්ත්‍රීපුරුෂ සමාජභාවීය සමාජානුයෝජනයේ ප්‍රමුඛ නියෝජිතයන්.

04. මාක්ස්වාදී ස්ත්‍රීවාදයේ සහ සමාජවාදී ස්ත්‍රීවාදයේ ප්‍රධාන විවාද මොනවා ද?

05. තුර්කියේ මුස්තාපා කෙමාල් රෙජීමය යටතේ කාන්තා විමුක්තිය පිළිබඳ නවීකරණ ක්‍රියාවලිය සාකච්ඡා කරන්න.

06. **එක්කෝ**

    ඔබ අධ්‍යයනය කළ රටක් ඇසුරින් ප්‍රාදේශීය ආණ්ඩුකරණය තුළ කාන්තාවන්ගේ දේශපාලන සහභාගීත්වය විභාග කරන්න.

    **නැතහොත්**

    ඔබ අධ්‍යයනය කළ රටක් ඇසුරින් පශ්චාත් යුධ සන්දර්භය තුළ කාන්තාවගේ තත්ත්වය විවේචනාත්මක ව විභාග කරන්න.

(අ. පි. බ)

07. පහත සඳහන් මාතෘකා **දෙකක් (02)** පිළිබඳ සටහන් ලියන්න.

(i) රැඩිකල් ස්ත්‍රීවාදය

(ii) කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය

(iii) ස්ත්‍රීවාදයේ පළමු සහ දෙවන රැළි

(iv) ලිංගිකත්වය සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය

**********************